# පශ්චාත් යුද ශ්‍රී ලංකාව තුළ කාන්තාවන්ගේ ආර්ථික සම්බන්ධතා : වෙට්ටිකාඩු ගම්මානයේ බීඩි කර්මාන්තයේ නියුතු කාන්තාවන්ගේ තත්ත්වය

## සාරාංශය

මෙම ප්‍රතිපත්ති සාරාංශය "ප්‍රචණ්ඩත්වයේ දේශපාලන ආර්ථිකය : පශ්චාත් යුද ශ්‍රී ලංකාව තුළ කාන්තාවන්ගේ ආර්ථික සම්බන්ධතා" නමැති පර්යේෂණ පත්‍රිකාව මත පදනම් වන අතර යාපනයේ ගම්මානයක[1] කාන්තාවන් බීඩි එතීමෙහි නිරතව සිටීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි. කාන්තාවන් එවැනි අතිශය අස්ථාවර රැකියාවක දිගින් දිගට ම නිරතව සිටින්නේ මන්ද යන්නත් යුද සමයක සිට යුද්ධයෙන් තොර කාල පරිච්ඡේදයක් දක්වා සංක්‍රමණය වීමේදී ඔවුන් උදෙසා පවත්නා විකල්ප ආදායම් උත්පාදන අවස්ථාවන් කවරේ ද යන්නත් අවබෝධ කර ගැනීමට එය උත්සාහ දරයි.

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දශක තුනකට වඩා පැවති සිවිල් යුද්ධය 2009 මැයි මාසයේ අවසන් වීමෙන් පසුව යුද්ධයෙන් පීඩාවට පත් රටේ උතුරු නැගෙනහිර ප්‍රදේශවල කාන්තාවන්ට එරෙහි කායික හා ලිංගික ප්‍රචණ්ඩත්වය සැලකිය යුතු ජාත්‍යන්තර හා ජාතික අවධානයකට පාත්‍ර විය. මෙම අධ්‍යයනය කායික ප්‍රචණ්ඩත්වයේ සුලභ ස්වරූපවලින් ඔබ්බට යමින් දේශපාලනික හා ආර්ථික සම්බන්ධතා හා ක්‍රියාවලි නිසා ඇතිවී තිබෙන ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය ද එම සම්බන්ධතා හා ක්‍රියාවලින් ස්ත්‍රීපුරුෂ සමාජ භාවීය, කුල හා පන්ති පීඩනය සමග එක් වන ආකාරය ද අනාවරණය කිරීමට උත්සාහ කරයි. ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල නිරත වන විට නිවස තුළ හා ඉන් පිටත යන දෙතැන දී ම කාන්තාවන් එදිනෙදා අත්දකින ප්‍රචණ්ඩත්වයන්ට දායක වන සාධක විශ්ලේෂණය කිරීම සඳහා පර්යේෂකයන් විසින් යොදා ගැනුණේ ස්ත්‍රීවාදී දේශපාලන ආර්ථික ප්‍රවේශයකි. මෙම අධ්‍යයනය යාපනය අර්ධද්වීපයේ පිහිටි වෙට්ටිකාඩු නම් ධීවර ගම්මානයේ වෙසෙන බීඩි ඔතන්නියන් පිළිබඳ සිද්ධි අධ්‍යයනයක් පදනම් කර ගෙන සිය සොයා ගැනීම් විස්තර කරන්නේ එම අභිමතාර්ථය සාධනය කර ගැනීම සඳහා ය.

ශ්‍රී ලංකාවේ බීඩි කර්මාන්තය ප්‍රමාණවත් පර්යේෂණයකට ලක්ව නැති නිසා එහි වේගවත් වර්ධනයට දායක වන කොන්දේසි, විශේෂයෙන් ම දශක පහකට ආසන්න කාලයක් තිස්සේ මෙම කර්මාන්තය තුළ අඛණ්ඩව ශ්‍රමය වගුරා ඇති බීඩි ඔතන්නියන්ගේ තත්ත්වය විමසා බලමින් සම්පාදනය කළ තොරතුරු පවතින්නේ සීමිත වශයෙනි. එහෙයින් මෙම අධ්‍යයනය මගින් බාහිර සමාජයට එතරම් විවර නොවුණු කරුණු අවබෝධ කර ගැනීමට උත්සාහ දරාඇත. "කාන්තාවන්ට බීඩි එතීමෙහි නිරත වීමට සිදු වූයේ කුමක් නිසා ද? ඔවුන් උදෙසා පවත්නා විකල්ප මොනවා ද?"

* නිර්නාමිකත්වය ආරක්ෂා කිරීම සඳහා මනක්කල්පිත නම් යොදා ගෙන ඇත.

[1] ගැටුමෙන් පීඩාවට පත් තත්ත්වයන් තුළ ජීවනෝපායන්, මූලික සේවාවන් හා සමාජ රැකවරණය පිළිබඳව විමසා බලන, වසර හයක් පුරා දිවෙන ගෝලීය පර්යේෂණ වැඩසටහනක් වන සුරක්ෂිත ජීවනෝපාය පර්යේෂණ සමූහායතනයට (Secure Livelihoods Research Consortium — SLRC) දායකත්වය ලබා දීමක් ලෙස මෙම කාර්ය පත්‍රිකාව රචනා කරන ලද්දේ ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ (Centre for Poverty Analysis — CEPA) පර්යේෂකයන් විසිනි.

මෙතැනින් ලබාගත හැක : https://securelivelihoods.org/publication/womens-economic-relations-in-post-war-sri-lanka-the-case-of-beedi-rollers-in-vettikadu/

## ප්‍රවේශය

කාන්තාවන්ගේ ජීවිත හා ආර්ථික සම්බන්ධතා පිළිබඳව සහ ප්‍රචණ්ඩත්වය ප්‍රකාශයට පත් වන ආකාරයන් පිළිබඳව ප්‍රමාණවත් විස්තර මතු කර ගැනීම සඳහා ගුණාත්මක ප්‍රවේශයක් යොදා ගන්නා ලදි. වෙට්ටිකාඩු ගම්මානය සිද්ධි අධ්‍යයනයක් ලෙස යොදා ගත් නිසා එම විශේෂිත ගම්මානයේ දිවි ගෙවන කාන්තාවන්ගේ සමාජීය, දේශපාලනික හා ආර්ථික යථාර්ථයන් පිළිබඳව සියුම් අවබෝධයක් ලබා ගැනීමට මෙම අධ්‍යයනය සමත් විය.

දත්ත රැස් කරන ලද්දේ 2015 සැප්තැම්බර් සහ 2016 ජනවාරි අතරතුර ය. සමස්තයක් ලෙස, ප්‍රමුඛ පුද්ගලයන් සමග සම්මුඛ සාකච්ඡා 41ක් පවත්වන ලදි: කාන්තා ක්‍රියාකාරීන්ගේ කණ්ඩායම්වල නියෝජිතයන්, ලාභ නොලබන සංවිධානවල නියෝජිතයන්, විද්වතුන්, රජයේ නිලධාරීන්, ගම්මානයේ කාන්තාවන් සහ ගමේ සිටින තනතුරු බලය සහිත වෙනත් පුද්ගලයෝ මෙහි දී සම්මුඛ සාකච්ඡාවට ලක් කරන ලදී. දත්ත රැස් කිරීමේ දී අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා 15ක් ද පැවැත්වූ අතර එම පුද්ගලයන් සමග පසු විපරම් සම්මුඛ සාකච්ඡා ද පවත්වනු ලැබිණ. අවසානයේ ගම තුළ හා පිටත ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා අටක් ද පවත්වන ලද අතර නිවසේ සිට රැකියාව කරන විවිධ කාන්තා කණ්ඩායම්, ගමෙන් පිටත රැකියාවල නියුතු කාන්තාවන්, තරුණියන්, ගමේ වැඩිහිටියන්, ගමේ දරුවන් යන පාසල්වල ගුරුවරුන්, යාපනයේ කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරීන් සහ අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල රජයේ නිලධාරීහු ඒවාට සම්බන්ධ කර ගැනුණි.

මෙම අධ්‍යයනය සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය ද යොදා ගත් අතර එය තමන් ජීවත් වන හා රැකියාව කරන විශේෂිත වාතාවරණයන් තුළ දී ජනයා කරන ක්‍රියාවන් හා අන්තර් ක්‍රියාවන් නිරීක්ෂණය කිරීමට හා තේරුම් ගැනීමට මෙන් ම නොපැවසූ දෙය සහ පිළිතුරු දුන් ආකාරය වටහා ගනිමින් ප්‍රතිචාර දක්වන්නන් පැවසූ දෙය වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමට ද හැකියාව ලබා දුන්නේ ය.

## ප්‍රතිඵල:

### පසුබිම සැකසුණු ආකාරය

වෙට්ටිකාඩු යනු යාපනය අර්ධද්වීපය තුළ, ආසන්නතම වෙරළ තීරයට කි.මී. 4ක් පමණ දුරින් පිහිටි ධීවර ගම්මානයකි. ධීවර කර්මාන්තය සමාජීය හා සංස්කෘතික වශයෙන් ගත් විට පිරිමින්ගේ අවකාශයක් ලෙස ගොඩ නැගී ඇති හෙයින් ධීවර ගම්මානයක් වුව ද වෙට්ටිකාඩු ගම්මානයේ කාන්තාවන් ධීවර කර්මාන්තයෙන් හා ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් බැහැර කරනු ලැබ ඇත. යුද්ධය අතරතුර දී ධීවරයන්ට විවිධ සීමාවන් පැනවුණු අතර ඒවා ඔවුන්ගේ සංචලනයට ද ආදායමක් උපයා ගැනීමේ හැකියාවට ද බලපෑවේ ය. යුද්ධය නිසා ධීවරයන් මිය යාම් හා අතුරුදන් වීම් ද සිදු වූ අතර ඒ හේතුවෙන් ඔවුන්ගේ මව්වරුන්, සොහොයුරියන්, බිරින්දෑවරුන් හා දරුවන් ස්ථිර ආදායම් මූලාශ්‍රයක් නැති තත්ත්වයට පත් විය. එවැනි කාල පරිච්ඡේදයක දී, කුටුම්බයේ වියදම් සරිකර ගැනීම සඳහා බීඩි එතීමෙන් අගනා දායකත්වයක් ලැබිණ. පශ්චාත් යුද කාල පරිච්ඡේදයේ දී පිරිමින් ගමේ සිටින නමුත් ධීවර කර්මාන්තයෙන් ලැබෙන ආදායම සහතික හෝ නිත්‍ය නොවන නිසා කාන්තාවන්ට දිගින් දිගට ම විකල්ප ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සොයා යාමටත් කුටුම්බයේ එදිනෙදා අවශ්‍යතාවන් සඳහා මුදල් ණයට ගැනීමටත් සිදු වී ඇත.

යුද්ධය සහ දරිද්‍රතා තත්ත්වයන් නිසා අධ්‍යාපනය කඩාකප්පල් වූ අතර කාන්තාවන් ගම තුළ හෝ තම නිවහන් තුළ බීඩි එතීමෙහි නිරත වීම ආදායම් උත්පාදන මාර්ගයක් බවට පත් වූයේ ප්‍රාග්ධන වියදමක් දැරීමට සිදු නොවීම නිසා, අවම නිපුණතා පුහුණුවක් අවශ්‍ය වීම නිසා මෙන් ම අතරවාරයේ නිවසේ එදිනෙදා කටයුතු හා තමන් විසින් ඉටු කළ යුතු රැක බලා ගැනීමේ කටයුතු ද වඩාත් හොඳින් කළමනාකරණය කර ගත හැකි වීම නිසා ය. පශ්චාත් යුද සමය තුළ, වෙට්ටිකාඩු ගම්මානයේ කාන්තාවන්ගෙන් බහුතරයක් දිගින් දිගට ම බීඩි එතීමෙහි නිරතව සිටින අතර කාන්තාවෝ කිහිප දෙනෙක් රාජ්‍ය අංශයේ රැකියාවල ද අනෙක් අය යාපනය නගරය තුළ නොවිධිමත් අංශයේ[2] හා ස්වයං රැකියා ක්‍රියාකාරකම්වල ද නිරතව සිටිති.

[2] ඔසු සල්, රෙදි සාප්පු හෝ ඖෂධ සංයෝග කරන කම්හල් තුළ වැටුප් ලබන රැකියාවල.

## බීඩි එතීම

බීඩි එතීම ශ්‍රම සූක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් වුවත් ගෘහස්ථ පදනමකින් කෙරෙන හෙයින් උතුරු පළාත තුළ බීඩි මිටි අසුරා වෙළඳ පොළට ඉදිරිපත් කරන නල්ලූර්හි පිහිටි භාරතී* සමාගම සමග බීඩි ඔතන්නියන්ට සෘජු සම්බන්ධයක් නැත. කාන්තාවන්ට ගෙවීම් කරන්නේ ඔවුන් නිෂ්පාදනය කරන බීඩි මිටි ගණන පදනම් කර ගෙන බැවින් රැකියා ගිවිසුමක් හෝ සෞඛ්‍ය රක්ෂණය වැනි රැකියා ප්‍රතිලාභ ඔවුන්ට හිමි වී නැත. ස්ථාපිත සමාගමක් මෙම කාන්තාවන් ඔතන බීඩි මිටි ලබා ගන්නා බවට එක ම සාක්ෂිය ලෙස පවතින්නේ ගමේ නිවසක දුම්කොළ ගබඩා කර තබා ගැනීම සඳහා අවසර ලබා ගැනීම පිණිස සුරාබදු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් බලපත්‍රයේ ඡායා පිටපතක් පමණකි. වෙට්ටිකාඩු ගම්මානය තුළ එවැනි නිවාස පහක් පවතින අතර ඒවා බීඩි එකතු කිරීමේ හා බෙදා හැරීමේ මධ්‍යස්ථාන ලෙස ක්‍රියා කරයි. සාදා නිම කළ බීඩි මිටි එකතු කර ගෙන යාම, තෙඬු කොළ, දුම්කොළ හා බීඩි ඔතන නූල් තොගය අඩු වන විට නැවත පිරවීම සහ කාන්තාවන්ට මාසිකව මුදල් ගෙවීම සිදු කෙරෙන්නේ එම මධ්‍යස්ථානවල සිටින සමාගමේ නියෝජිතයා (අතරමැදියා) විසිනි.

ක්ෂය රෝගය, මයිකොසිස්, පිළිකා, චර්ම රෝග හා වෙනත් රෝගී තත්ත්වයන් බොහෝ සේ ඇති වීමට තුඩු දිය හැකි එක තැන වාඩි වී වැඩ කිරීම, සනීපාරක්ෂක නොවන සේවා කොන්දේසි සහ දුම්කොළවලට නිරන්තරයෙන් නිරාවරණය වීම හේතු කොට ගෙන බීඩි එතීමෙහි නිරත වීම ආශ්‍රිතව ඇති වන ආවේණික වෘත්තීය සෞඛ්‍ය අවදානම් ගැන ඉන්දියාවෙන් ලැබෙන වාර්තා රැසකින් ම සාක්ෂි සම්පාදනය වේ.[3] කාන්තාවන් බොහෝ දෙනෙකු බීඩි එතීමෙහි නිරත වන්නේ තම නිවෙස් තුළ වන අතර වාතාශ්‍රය අඩුකම සහ දරුවන් ජීවත් වන, ආහාර ගන්නා හා නිදා ගන්නා පෞද්ගලික අවකාශය රැකියා අවකාශයෙන් පැහැදිලි ලෙස වෙන් කර නොතිබීම නිසා ඔවුන්ගේ දරුවන් ද නිකොටින් අවශෝෂණය කර ගැනීමේ අවදානම පවතී.[4]

සෞඛ්‍ය අවදානම් විශේෂයෙන් ම ශ්වසන රෝග ඇති විය හැකි බව හඳුනා ගෙන තිබියදීත් සමාගම හෝ අතරමැදියා කම්කරුවන්ට මුඛ ආවරණ හෝ අත් වැසුම් ලබා නොදෙයි. සමහර කම්කරුවන් තමන්ගේ නාසය හා මුඛය රෙදි කඩකින් ආවරණය කර ගැනීමේ වැදගත්කම වටහා ගෙන ඇති නමුත් අපහසු ගතියක් දැනෙන නිසා එසේ නොකරන බව ඔවුහු පවසති.

## ගමෙන් පිටත රැකියා කිරීම

ගමෙන් පිටත, කාන්තාවන්ට 'ගැළපෙන' රැකියා ඇත්තේ සීමිත වශයෙනි.[5] රෙදි සාප්පු හා ඔසු සල් වැනි තැන්වල රැකියා ලබා ගත හැකි නමුත් කවුන්ටරය පිටුපස දී කාන්තාවෝ සූරාකෑමේ හා හිංසනයේ ස්වරූප ගණනාවකට මුහුණ දෙති. එපමණක් නොව, රැකියාවේ නියමයන් හා කොන්දේසි ද දරුණු ය: නිසි විවේක කාලයන් හෝ වැසිකිළි ඇතුළු පහසුකම් නැත; රැකියා ගිවිසුම්, නිවාඩු සහ ව්‍යවස්ථාපිත සුභසාධන ප්‍රතිලාභ නැත; වැටුප් පහළ මට්ටමක පවතින අතර බොහෝ විට සම්පූර්ණයෙන් හෝ කලට වේලාවට නොගෙවනු ලැබේ. වැටුප් ලබන රැකියාවල නිරත කාන්තාවන් පැවසුවේ තමන්ට සාමාන්‍යයෙන් ගෙවන්නේ තමන්ගේ රැකියාවෙහි ම නිරත පිරිමි කම්කරුවන්ට වඩා බෙහෙවින් අඩු වැටුපක් බව යි: පිරිමින්ට දිනකට රු. 1,500ක් පමණ ලැබෙන නමුත් එම පැය ගණන ම එම රැකියාව ම කරන කාන්තාවන්ට දිනකට ගෙවනු ලබන්නේ රු. 600ක් තරම් සොච්චම් වැටුපකි. රැකියාවලට බඳවා ගැනීමේදී කුලය ද නිල නොවන සාධකයක් ලෙස ක්‍රියාත්මක වන බව කාන්තාවෝ වාර්තා කළහ. සූරා කෑමට වැඩි ඉඩක් ලැබෙන නිසා සමහර රෙදි සාප්පු වඩාත් පහත් කුලවලට අයත් වඩාත් දුප්පත් කාන්තාවන් බඳවා ගන්නා බව ඔවුහු කියා සිටියහ.

කෙසේ වුව ද, ගමෙන් පිටතට ගමන් කරන විට ද අවදානමට ලක් විය හැකි නිසා කාන්තාවන් මුහුණ දෙන අස්ථාවරත්වය රැකියා අවකාශයට පමණක් සීමා නොවේ. කාන්තාවන් සහ පාසල් යන ගැහැණු ළමයි රැකියාවට හෝ පාසලට බසයෙන් යන විට පමණක් නොව පයින් හෝ පාපැදියෙන් යන විට පවා ලිංගික හිංසනයට ලක් වූ අවස්ථා වාර්තා කරති.

---

[3] National Commission for Women (2005). *A Report on Women Beedi Workers.* New Delhi. මෙතැනින් ලබා ගත හැකි ය: http://ncw.nic.in/pdfreports/Women%20Beedi%20Workers.pdf.

[4] Nakkeeran, S.K. and Pugalendhi, S.B. (2010). A study on occupational health hazards among women beedi rollers in Tamil Nadu, India. මෙතැනින් ලබා ගත හැකි ය: https://core.ac.uk/download/files/432/12026397.pdf.

[5] කාන්තාවන්ට ලබා ගත හැකි සහ සුදුසු හෝ ගැළපේ යැයි සැලකෙන රැකියා වර්ග තීරණය කරන සමාජීය හා සංස්කෘතික සාධක. නිවසින් පිටත රැකියාව කිරීම නිසා කුටුම්බයේ ආදායමට දායක වීමට අමතරව රැක බලා ගැනීමේ කාර්යයන් ඉටු කෙරෙන බව සහතික කිරීමට ද සිදු වන හෙයින් වැඩිමනත් කාර්ය භාරයක් ඉටු කිරීමට සිදු වේ.

## නිගමනය

මෙම අධ්‍යයනය වෙට්ටිකාඩු ගම්මානයේ කාන්තාවන්ට තමන්ගේ ආර්ථික හා අවකාශීය ජීවිත පාලනය කළ නොහැකි ය යන කරුණ ඉස්මතු කර දක්වයි. එහි ප්‍රතිඵලය වී ඇත්තේ ජීවිකාව සරි කරන්නන් හා රැක බලා ගන්නන් ලෙස තමන් ඉටු කරන දෙයාකාර කාර්යභාරය තවත් සංකීර්ණ කර ගනිමින් ගම්මානයෙන් පිටත රැකියාව කිරීමේ අන්තරාය හෝ බීඩි එතීමෙහි හෝ වෙනත් ගෘහස්ථ ක්‍රියාකාරකම්වල නිරත වෙමින් ගම තුළ පවත්නා සාපේක්ෂ සුරක්ෂිතතාව තුළ රැකියාව කිරීමේ අන්තරාය යන දෙකින් එකක් තෝරා ගැනීමට ඔවුන්ට සිදු වීම යි. පසුව සඳහන් කළ රැකියාවන්හි නිරත වීම නිසා ස්ත්‍රී පුරුෂ සමාජ භාවය කරණ කොට ගෙන තමන් මත පැටවී තිබෙන දෙයාකාර කාර්ය භාරය ඉටු කිරීමට වැඩි හැකියාවක් ලැබෙන්නට ඉඩ ඇති නමුත් 'සාර්ථක ලෙස' මෙම කාර්ය භාරය ඉටු කිරීමට සමත් වීම යන්නෙන් අදහස් වන්නේ ඔවුන්ගේ කායික හා මානසික යහපැවැත්ම දිගින් දිගට ම අවදානමට ලක් විය හැකි බව යි. දුම්කොළ පදනම් කර ගත් නිෂ්පාදන පරිභෝජනය අධෛර්යමත් කිරීම ඉලක්ක කර ගෙන ප්‍රතිපත්තිවල කර ඇති වෙනස්කම් නිසා තවත් අභියෝග මතු වන අතර බීඩි නිෂ්පාදනය සඳහා අවශ්‍ය කරන ප්‍රධාන අමුද්‍රව්‍යයක් වන දුම්කොළ ආනයනය මත පැනවෙන බදු ඉහළ යාමට ඒවා හේතු වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස භාරතී* සමාගම ආනයනය කරන දුම්කොළ ප්‍රමාණය අඩු කිරීම බීඩි එතීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණය අඩු වීමට හේතු වී ඇති අතර එය බීඩි ඔතන්නියන්ගේ ආදායමට සෘජු බලපෑමක් කර ඇත.

## නිර්දේශ

මෙම ගැටලු විසඳීමට ගත හැකි එක් ප්‍රධාන පියවරක් වන්නේ බීඩි එතීමෙහි නිරත වීම ආශ්‍රිත අනතුරු පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරන අතර නිවස තුළ දී හා පිටත දී කාන්තාවන් අත්දකින ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයට විසඳුම් ලැබෙන විකල්ප ජීවනෝපාය අවස්ථාවන් සඳහා අවස්ථාවන් නිර්මාණය කිරීම යි.

විකල්ප ජීවනෝපාය අවස්ථාවන් සලසා ගැනීමේ හැකියාව වැඩි කිරීම පිණිස අඛණ්ඩව අධ්‍යාපනය ලැබීමට ජනතාව දිරි ගැන්වීම සඳහා ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේ දී සමාජ හා ආර්ථික පසුබිම වෙනස් වෙමින් පවත්නා බව, දුම්කොළ මත ආනයන බදු පැනවීම සහ යුද්ධය නොමැති වීම හඳුනා ගැනීම ද වැදගත් වේ. දරුවන්ට පාසල් යාමේ හැකියාව ලබා දීම සහ දරුවන් පාසල් යාමට දිරි ගැන්වීම ඔවුන් දරිද්‍රතාවෙන් නිදහස් වීම වළක්වන සමාජ හා ආර්ථික ව්‍යුහයන්ගෙන් ගැලවී ගත හැකි ක්‍රමයක් සම්පාදනය කරයි. මේ සඳහා යෝජිත නිර්දේශවලින් සමහරක් පහත දැක්වේ:

- බීඩි එතීම ආශ්‍රිතව ඇති විය හැකි සෞඛ්‍ය අවදානම් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;
- මේ වන විට බීඩි එතීමෙහි නිරතව සිටින කාන්තාවන්ට විකල්ප ආදායම් උත්පාදන අවස්ථාවන් සොයා යා හැකි වන පරිදි ඔවුන් උදෙසා නිපුණතා පුහුණු සම්පාදනය කිරීම;
- අඛණ්ඩව අධ්‍යාපනය ලැබීමට දරුවන් දිරි ගැන්වීම සඳහා අඛණ්ඩ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

මෙම ප්‍රකාශනය සඳහා සහයෝගය ලැබුණේ Secure Livelihoods Research Consortium (SLRC) ආයතනය මගින් වන අතර ඊට අවැසි මූල්‍ය ආධාර එක්සත් රාජධානියේ අන්තර්ජාතික සංවර්ධන දෙපාර්තුමේන්තුව හා අයර්ලන්ත හා යුරෝපා සංගමයෙන් ලැබුණි. මෙමගින් ඉදිරිපත් වන කරුණු පර්යේෂකයන් විසින් ඉදිරිපත් කළ දෑ වන අතර මෙමගින් එක්සත් රාජධානියේ රාජ්‍ය ප්‍රතිපත්ති හෝ SLRC සහ අනෙක් ආයතනවල අදහස් ඉදිරිපත් නොවන බව සලකන්න.

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) යනු දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ගැටලු පිළිබඳව දැනුම හා අවබෝධය පුළුල් කිරීමට කටයුතු කරන ස්වාධීන ශ්‍රී ලාංකික බුද්ධිමතුන් කණ්ඩායමක එකතුවකි. දරිද්‍රතාව යනු වහා විසඳුම් සෙවිය යුතු සමාජ ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අසාධාරණයන් සිදුවන්නක් බව අපගේ අවබෝධයයි. දරිද්‍රතාව සම්බන්ධ ගැටලු ආමන්ත්‍රණය කිරීමට නම් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රතිපත්ති හා භාවිතයන් වෙනස් විය යුතු බව හා දරිද්‍රතාවෙන් පෙළෙන ජනයා සමග එක්ව වැඩ කළ යුතු බවට CEPA ආයතනය විශ්වාස කරයි. ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් හා ව්‍යාපෘතිවලදී දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීම සඳහා දායක වීමට CEPA ආයතනය ප්‍රමුඛත්වය ලබා දේ.

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය
නො. 29, ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07.
දුරකථන : +94 11 469 0200, 2676955 ෆැක්ස් : +94 11 2676959 විද්‍යුත් තැපෑල : info@cepa.lk

www.cepa.lk https://www.facebook.com/CepaSL/ https://twitter.com/cepaSL https://www.youtube.com/cepasl